මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
மனிதவலு மற்றும் வேலைவாய்ப்புத் திணைக்களம்
Department of Manpower and Employment

# කාර්යසාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# Performance Report
# 2018

## පටුන


**1. හැදින්වීම**

1.1 මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
1.2 රාජකාරී ඉටු කිරීමේ විෂය පථය
1.3 උපාය මාර්ගික දිශානතිය
1.4 දෙපාර්තමේන්තුවේ ගමන් මඟ
1.5 දිර්ඝ කාලීන ඉලක්ක
1.6 දෙපාර්තමේන්තුවේ අරමුණු
1.7 දෙපාර්තමේන්තුවේ අංශ

**2. සංවිධාන ව්‍යුහය**

2.1 අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල තොරතුරු 2018.12.31
2.2 මානව සම්පත් සංවර්ධන සහකාර නිලධාරින්ගේ තොරතුරු සාරාංශය - 2018

**3. පාලන අංශය**

3.1 කාර්ය මණ්ඩල තොරතුරු
3.2 කාර්ය මණ්ඩලය පුහුණුව

**4. ගිණුම් අංශය**

**5. රැකියා නිර්මාණ , ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය**

5.1 රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන වැඩසටහන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය
5.2 වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය
5.3 රැකියා නිර්මාණ ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය මගින් පවත්වන ලද වැඩසටහන්හි ලබා ගන්නා ලද ඡායාරූප

**6. මිනිස්බල සැලසුම්, සංවර්ධන හා පර්යේෂණ අංශය**

6.1 ශ්‍රම වෙළඳපල තොරතුරු ඒකකය
6.2 ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්ති මෙහෙයුම් ඒකකය
6.3 රැකියා කේන්ද්‍රය හා එහි ප්‍රගතිය

# 1. හැඳින්වීම

## 1.1 මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

2010.02.12 දිනැති අංක 1640/31 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව 2010 වසරේදී කම්කරු සබඳතා හා මිනිස්බල අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කරන ලදි. වර්තමානයේ කම්කරු, හා වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තුව වෙත රාජ්‍ය රැකියා සේවාවන් පවත්වාගෙන යාම හා ජාතික මානව සම්පත් හා රැකියා ප්‍රතිපත්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ වගකීම ද පැවරී ඇත.

## 1.2 රාජකාරී ඉටු කිරීමේ විෂය පථය

**මෙම දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කාර්යන් ඉටු කරනු ලැබේ.**

- ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන කටයුතු
- වෘත්තීය මාර්ගෝපදේශනයට අයත් කටයුතු
- ශ්‍රම වෙළඳපල තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය හා බෙදාහැරීම
- රැකියා පියස (Jobs Net) මගින් සිදුකෙරෙන වෙනත් සේවාවන්

සහ ඉහත විෂයන්ට ආනුෂාංගික සහ සම්බන්ධිත සෙසු සියලු කටයුතු.

## 1.3 උපාය මාර්ගික දිශානතිය

**<u>දැක්ම</u>**

**ලෝක මට්ටමේ ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්**

<u>මෙහෙවර</u>

**පුළුල් නිපුණතාවයෙන් යුත්, ක්‍රියාශීලී සහ ගෝලීය වශයෙන් තරඟකාරී ශ්‍රම බලකායක් ගොඩනැගීම සහ අපේ මානව සම්පත්වල මුළු ශක්තිය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා යොදා ගැනීම**

## 1.4 දෙපාර්තමේන්තුවේ ගමන් මඟ

2010 වර්ෂයේ පිහිටුවන ලද මෙම දෙපාර්තමේන්තුව මඟින් මේ දක්වා ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකය මගින් පවත්වනු ලබන සමීක්ෂණ උපයෝගී කර ගනිමින් වෘත්තීය මාර්ගෝපදේශනයට හා රැකියා නිර්මාණ ප්‍රවර්ධනයට අදාළව ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් රාශියක් සිදු කර ඇති අතර එමගින් ප්‍රතිලාභීන් විශාල සංඛ්‍යාවකට ප්‍රතිලාභ ලබා දෙමින් හා රැකියා කේන්ද්‍රය හරහා මෙරට ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා රැකියා විරහිත තරුණ තරුණියන් හට පෞද්ගලික අංශයේ රැකියා ලබා දීම ද සිදු කර ඇත.

## 1.5 දීර්ඝ කාලීන ඉලක්ක

1. ගෝලීය වශයෙන් තරඟකාරී , නිපුනතාවයෙන් සහ බහුවිධ කුසලතාවයෙන් යුත් ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක් ගොඩ නැංවීම
2. විරැකියාව අවම කිරීම උදෙසා විවිධ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම
3. සංවිධිත පරිපූර්ණ ශ්‍රම වෙළඳපල තොරතුරු පද්ධතියක් ඇති කිරීම

## 1.6 දෙපාර්තමේන්තුවේ අරමුණු

ඉහත ඉලක්කයන් ඉටුකරගැනීම බලපැවැත්වන්නේ පහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම තුළිනි.


1. ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය සකස් කර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
2. කුසලතා නොගැලපීම යන ව්‍යුහාත්මක සේවා වියුක්ති ගැටළුව විසඳීම
3. වර්තමාන ශ්‍රමබලකායට අයත් සහ අනාගතයේ ශ්‍රම වෙළඳපොළට එක්වීමට නියමිත සියලුම ශ්‍රී ලාංකිකයන් හට නිවැරදි වෘත්තීය දිශානතිය නිශ්චය කරගැනීම සඳහා පහසුකම් සැලසීම.
4. මිනිස්බල සැලසුම් කිරීම.සංවර්ධනය හා පුරෝකථනය
5. අවිධිමත් අංශය සංවර්ධනය
6. පෞද්ගලික අංශයේ රැකියා සඳහා රැකියා අපේක්ෂකයින් පෙළඹවීම
7. නිදහස් රාජ්‍ය රැකියා සේවය ලබාදීම
8. අවධානමට ලක් වු කණ්ඩායම්, ආබාධිත පුද්ගලයන් හා ඌන සංවර්ධිත ප්‍රදේශවල වෙසෙන පුද්ගලයන් සඳහා මිනිස්බල හා සේවා නියුක්තිය ආශ්‍රිත පහසුකම් සැපයීම
9. ගෝලීය හා දේශීය වශයෙන් නිවැරදි ශ්‍රම වෙළඳපොළ තොරතුරු සියළුම ශ්‍රී ලාංකිකයන්ට ලබාදීම
10. දේශීය හා ගෝලීය ශ්‍රම වෙළඳපොළ නැම්යාවන් පූරෝකථනය

මේ අයුරින් විරැකියාව අවම කිරීම හා යහපත් රැකියා ඇතිකිරීම යන සද්කාරයයන් ඉටුකර ගැනීම උදෙසා මෙම දෙපාර්තමේන්තුව සිය මානව සම්පත් උපයෝගී කරගනිමින් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

## 1.7 දෙපාර්තමේන්තුවේ අංශ

- පාලනඅංශය, සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය
- ගිණුම් අංශය
- රැකියා නිර්මාණ,ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය
    - රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන ඒකකය
    - වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය
- මිනිස්බල සැලසුම්,සංවර්ධන හා පර්යේෂණ අංශය
    - ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකය
    - ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්ති ඒකකය
    - මහජන රැකියා සේවය

## 2. සංවිධාන ව්‍යුහය



අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ)
අධ්‍යක්ෂ (පාලන)
අධ්‍යක්ෂ (මිනිස්බල සැලසුම් සංවර්ධන හා පර්යේෂණ)
ප්‍රධාන ගණකාධිකාරි
සහකාර අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන) ශ්‍රී.ලං.ප.සේ
සහකාර අධ්‍යක්ෂ (වෘත්තීය මාර්ගෝපදේශ) ශ්‍රී.ලං.ප.සේ
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) ශ්‍රී.ලං.ක්‍ර. සේ
සහකාර අධ්‍යක්ෂ (පාලන) ශ්‍රී.ලං.ප.සේ
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) ශ්‍රී.ලං.ක්‍ර. සේ
සහකාර අධ්‍යක්ෂ (ශ්‍රම වෙළඳපොළ අධ්‍යනය) ශ්‍රී.ලං.ප.සේ
සහකාර අධ්‍යක්ෂ (මිනිස්බල සැලසුම් හා සංවර්ධන) ශ්‍රී.ලං.ප.සේ
සහකාර අධ්‍යක්ෂ (රැකියා සේවා සම්බන්ධීකරණය) ශ්‍රී.ලං.ප.සේ
ගණකාධිකාරි ශ්‍රී.ලං.ග.සේ
අභ්‍යන්තර විගණක ශ්‍රී.ලං.ග.සේ
පරිපාලන නිලධාරි
තොරතුරු තාක්ෂණ නිලධාරි II ශ්‍රේණිය
සම්බන්ධීකරණ වෘ.මා.නිලධාරි
සම්බන්ධීකරණ වෘ.මා.නිලධාරි
සම්බන්ධීකරණ වෘ.මා.නිලධාරි
භාෂා පරිවර්තක I ශ්‍රේණිය
ශාඛා ප්‍රධාන
ශාඛා ප්‍රධාන
මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් / සංවර්ධන නිලධාරීන්
මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් / සංවර්ධන නිලධාරීන්
මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් / සංවර්ධන නිලධාරීන්
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කළමනාකරණ සහකාර
කාර්යාල කාර්ය මණ්ඩලය රියදුරු කා.කා.සේ.
කාර්යාල කාර්ය මණ්ඩලය රියදුරු කා.කා.සේ.
කාර්යාල කාර්ය මණ්ඩලය රියදුරු කා.කා.සේ.
කාර්යාල කාර්ය මණ්ඩලය රියදුරු කා.කා.සේ.
1. ග්‍රාමීය රැකියා හා ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන
2. අවිධිමත් අංශයේ රැකියා ප්‍රවර්ධන වැඩසටහන
3. රැකියා යෝග්‍යතා සංවර්ධන වැඩසටහන
4. රැකියා සමාජ වැඩසටහන
1. වෘත්තීය මාර්ගෝපදේශ තොරතුරු පද්ධති සැකසීම හා බෙදාහැරීම
2. වෘත්තීය මාර්ගෝපදේශ අධ්‍යනය හා පර්යේෂණ
3. වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
1. වැඩසටහන් සැලසුම් කිරීමමෙහෙයවීම හා ඇගයීම
2. ක්ෂේත්‍ර වැඩසටහන්සම්බන්ධීකරණය
3. නව වැඩසටහන් හඳුනාගැනීම හා සැලසුම් කිරීම.
1. සාමාන්‍ය පරිපාලනය
2. කාර්ය මණ්ඩල හා ආයතන කටයුතු
3. දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන කටයුතු
4. ගබඩා සේවය
5. සුභසාධන කටයුතු
1. වාර්ෂික සැලසුම් සැකසීම හා වාර්තා සැකසීම.
2. කාර්ය මණ්ඩල සංවර්ධනය
3. ප්‍රගති ඇගයීම් කටයුතු
4. අනෙකුත් අංශ අතර සම්බන්ධීකරණය
5. දෙපාර්තමේන්තු ප්‍රකාශන
1. ශ්‍රම වෙළඳපොළ ප්‍රවනතා අධ්‍යනය
2. ශ්‍රම වෙළඳපොළ තොරතුරු එකතු කිරීම
3. විශ්ලේෂණය කිරීම හා බෙදාහැරීම
1. මිනිස්බලය පුරෝකථනය කිරීම.
2. ආංශික මිනිස්බල සැලසුම් සැකසීම
3. අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය මඟින් සැලසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතුකිරීම
4. මිනිස්බල සංවර්ධනය සඳහා ආදාළ ප්‍රතිපත්ති හා යෝජනා ක්‍රම සැකසීම හා ක්‍රියාත්මක කිරීම
1. ජාතික රැකීරක්ෂා සේවා ජාලයක් සැකසීම හා ක්‍රියාත්මක කිරීම
2. රැකියා සේවා සපයන ආයතන අතර සම්බන්ධීකරණ
3. රැකියා පොළ
1. දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණ කටයුතු
1.දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු

## 2.1 අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල තොරතුරු 2018.12.31

| අනු අංකය | තනතුර | අදාළ වන සේවය | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|---|
| **1** | අධ්‍යක්ෂ ජනරාල් | ශ්‍රී.ලං.ප.සේ (විශේෂ) | 1 | 1 | 0 |
| **2** | අධ්‍යක්ෂ (පාලන) | ශ්‍රී.ලං.ප.සේ I | 1 | 1 | 0 |
| **3** | අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ හාවෘත්තීය මාර්ගෝපදේශ අංශය) | ශ්‍රී.ලං.ප.සේ I | 1 | 0 | 1 |
| **4** | අධ්‍යක්ෂ (මිනිස්බල සැලසුම් හා පර්යේෂණ අංශය) | ශ්‍රී.ලං.ප.සේ I | 1 | 1 | 0 |
| **5** | ප්‍රධාන ගණකාධිකාරී | SLAcS I | 1 | 1 | 0 |
| **6** | අභ්‍යන්තර විගණක | SLAcS II/III | 1 | 0 | 1 |
| **7** | ගණකාධිකාරී | SLAcS II/III | 1 | 0 | 1 |
| **8** | ස.අධ්‍යක්ෂ (පාලන) | ශ්‍රී.ලං.ප.සේ II/III | 2 | 0 | 2 |
| **9** | ස.අධ්‍යක්ෂ (මිනිස්බල සැලසුම් හාපර්යේෂණ අංශය) | ශ්‍රී.ලං.ප.සේ II/III | 2 | 1 | 1 |
| **10** | ස.අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ හාවෘත්තීය මාර්ගෝපදේශ අංශය) | ශ්‍රී.ලං.ප.සේ II/III | 2 | 0 | 2 |
| **11** | ස.අධ්‍යක්ෂ (මිනිස්බල සැලසුම් හාපර්යේෂණ අංශය) | ශ්‍රී.ලං.ක්‍ර.සේ II/III | 1 | 1 | 0 |
| **12** | ස.අධ්‍යක්ෂ (රැකියා නිර්මාණ හාවෘත්තීය මාර්ගෝපදේශ අංශය) | ශ්‍රී.ලං.ක්‍ර.සේ II/III | 1 | 1 | 0 |
| **13** | පරිපාලන නිලධාරී | රා.කළ.සේ.අධි | 1 | 0 | 1 |
| **14** | භාෂා පරිවර්තක | භාෂා පරිවර්තක සේවය I/II | 1 | 0 | 1 |
| **15** | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | ශ්‍රී .ලං.තො.ස.තා.සේ 2පන්තිය II/III | 1 | 0 | 1 |
| **16** | සංඛ්‍යා ලේඛන නිලධාරී | ක්ෂේත්‍රගත/කාර්යාලගත II/III | 1 | 0 | 1 |
| **17** | වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් | ආශ්‍රිත සේවය | 85 | 32 | 53 |
| **18** | ව්‍යාපෘති නිලධාරීන් | ආශ්‍රිත සේවය | 3 | 3 | 0 |
| **19** | මානව සම්පත් සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවය | 560 | 510 | 50 |
| **20** | රාජ්‍ය කළමනාකරණ සහකාර | රා.කළ.සේ I/II/II | 25 | 23 | 02 |
| **21** | රියදුරු | රියදුරු සේවය | 8 | 7 | 1 |
| **22** | කාර්යාල කාර්ය සහයක | කාර්යාල කාර්ය සහයක සේවය II/III | 7 | 7 | 0 |
| | එකතුව | | **707** | **589** | **118** |

**2.2 දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් අනුයුක්ත, වෘත්තීය මාර්ගෝපදේශ / ව්‍යාපෘති / මානව සම්පත් සංවර්ධන සහකාර හා සංවර්ධන නිලධාරින්ගේ තොරතුරු සාරාංශය - 2018**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංඛ්‍යාව | ප්‍රාදේශීය මට්ටමින් අනුයුක්ත සංඛ්‍යාව | දිස්ත්‍රික්ක මට්ටමින් අනුයුක්ත සංඛ්‍යාව | මුළු සංඛ්‍යාව | ප්‍රාදේශීය මට්ටමින් පුරප්පාඩු | දිස්ත්‍රික් මට්ටමින් පුරප්පාඩු | අතිරික්ත සංඛ්‍යාව | මුළු පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| අම්පාර | 19 | 20 | 6 | 26 | 0 | 0 | 0 | 0 |
| අනුරාධපුර | 22 | 15 | 7 | 22 | 5 | 0 | 0 | 5 |
| බදුල්ල | 15 | 09 | 3 | 12 | 6 | 0 | 0 | 6 |
| මඩකලපුව | 14 | 14 | 8 | 22 | 0 | 0 | 0 | 0 |
| කොළඹ | 13 | 13 | 4 | 17 | 0 | 0 | 0 | 0 |
| ගාල්ල | 19 | 20 | 12 | 32 | 0 | 0 | 2 | 0 |
| ගම්පහ | 13 | 14 | 11 | 25 | 0 | 0 | 2 | 0 |
| හම්බන්තොට | 12 | 13 | 16 | 29 | 0 | 0 | 2 | 0 |
| යාපනය | 15 | 14 | 7 | 21 | 1 | 0 | 0 | 1 |
| මහනුවර | 20 | 19 | 14 | 33 | 1 | 0 | 0 | 1 |
| කෑගල්ල | 11 | 12 | 12 | 24 | 0 | 0 | 2 | 0 |
| කළුතර | 14 | 14 | 12 | 26 | 0 | 0 | 0 | 0 |
| කුරුණෑගල | 30 | 37 | 14 | 51 | 0 | 0 | 7 | 0 |
| මාතර | 16 | 17 | 13 | 30 | 0 | 0 | 1 | 0 |
| මාතලේ | 11 | 9 | 10 | 19 | 2 | 0 | 0 | 2 |
| මොණරාගල | 11 | 11 | 6 | 17 | 0 | 0 | 0 | 0 |
| නුවර එළිය | 5 | 4 | 1 | 5 | 1 | 0 | 0 | 1 |
| පුත්තලම | 16 | 12 | 3 | 15 | 5 | 0 | 0 | 5 |
| පොළොන්නරුව | 7 | 5 | 4 | 9 | 2 | 0 | 0 | 2 |
| රත්නපුර | 17 | 17 | 7 | 24 | 0 | 0 | 0 | 0 |
| ත්‍රිකුණාමලය | 11 | 8 | 4 | 12 | 3 | 0 | 0 | 3 |
| වවුනියාව | 4 | 4 | 2 | 6 | 0 | 1 | 0 | 1 |
| මන්නාරම | 5 | 3 | 2 | 5 | 2 | 0 | 0 | 2 |
| කිලිනොච්චි | 4 | 3 | 7 | 10 | 1 | 0 | 0 | 1 |
| මුලතිව් | 6 | 0 | 2 | 2 | 6 | 0 | 0 | 6 |
| එකතුව | **330** | **307** | **187** | **494** | **35** | **1** | **16** | **36** |

# 3. පාලන අංශය

පාලන අංශය යටතේ පහත සඳහන් ඒකකයන් ස්ථාපිත කර ඇත.

i. ආයතන අංශය
ii. සැලසුම් හා ප්‍රගති මෙහෙයුම් ඒකකය

දෙපාර්තමේන්තුවේ මෙහෙවර ඉටු කිරීම උදෙසා අභ්‍යන්තර පාලන ක්‍රියාවලියට දායක වීම තුලින් විශිෂ්ඨ කාර්ය සාධනයක් ළඟා කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුවේ ඉහළ කළමණාකාරිත්වයට සහය වීම පිණිස ආයතන කටයුතු හා සාමාන්‍ය පරිපාලන කටයුතු මෙහෙයවීම ඇගයීම හා නංවාලීම පාලන අංශය වෙත පැවරී ඇති මූලික කර්තව්‍යයකි. ඊට අමතරව දෙපාර්තමේන්තුවේ ගුණාත්මක භාවය පවත්වා ගැනීම සඳහා ප්‍රයෝජනවත් භෞතික අභිමතාර්ථයන්ට හා කාර්යයන්ට ගැළපෙන උසස් තත්ත්වයක් සහිත සේවක මණ්ඩලයක් පවත්වා ගැනීම, අංශ අතර මනා විධිමත් සම්බන්ධීකරණයක් ඇතිකර ගැනීම, කාර්යය මණ්ඩලයේ සුභ සාධන පහසුකම් නංවාලීම හා සෙසු අංශයන් සඳහා අවශ්‍ය සහායක සේවා සැපයීම ද පාලන අංශය මඟින් සිදු කරනු ලබයි.

### 3.1 කාර්ය මණ්ඩල තොරතුරු

#### 3.1.1 මාණ්ඩලික නිලධාරින් අළුතින් බඳවා ගැනීම

| අනු අංකය | නම | තනතුර | සේවයට පැමිණි දිනය |
|---|---|---|---|
| 1 | ඒ .හේමලතා මිය | ප්‍රධාන ගණකාධිකාරී | 2018.06.12 |

#### i. මාණ්ඩලික නිලධාරින් ස්ථාන මාරු වීම්

| අනු අංකය | නම | තනතුර | ස්ථාන මාරු වූ දිනය |
|---|---|---|---|
| 1 | එම්.එන්. ගුණවර්ධන මිය | අධ්‍යක්‍ෂ | 2018.02.28 |
| 2 | ටී.එච්.තාජුඩීන් මයා | ප්‍රධාන ගණකාධිකාරී | 2018.06.01 |
| 3 | එම්.ඒ.ටී.සෙනරත් මයා | අධ්‍යක්‍ෂ | 2018.08.01 |

## 3.2 කාර්ය මණ්ඩලය පුහුණු

මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුවේ නිලධාරින් සඳහා 2018 වර්ෂයේදී පහත සඳහන් පුහුණු වැඩසටහන් සඳහා යොදවා ඇත.

| අනුඅංකය | පාඨමාලාවේ/වැඩසටහනේ නම | පැවැත්වූ දිනය | වියදම (රු.) |
|---|---|---|---|
| | දේශීය පුහුණු | | |
| 1 | කාර්යාල ක්‍රම හා ලිපිගොනුකරණය නිලධාරීන් 64ක් සඳහා | 2018.02.28 /2018.02.23 | 4,337 |
| 2 | SDFL(Skills Development Fund LTD) | 2018.05.22-2018.05.23 | 17,000 |
| 3 | ප්‍රසම්පාදනය ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන නිලධාරීන් 50 ක් සඳහා | 2018.05.15/2018.05.11 | 38,165 |
| 4 | වෘත්තීය මාර්ගෝපදේශ පුහුණු වැඩසටහන | 2018 | 120,000 |
| 5 | මනෝවිද්‍යා උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව | 2018 | 70,000 |
| 6 | Government Payroll System Training Programme | 2018.07.24/25/26 | 36,000 |
| 7 | උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | 2017-2018 | 40,000 |
| 8 | අන්තර්ජාල ආරක්ෂණය සහ ළමා හා කාන්තා ආරක්ෂණය නිලධාරීන් 39 ක් සඳහා | 2018.08.27 | 10,710 |
| 9 | Project Proposal Programme නිලධාරීන් 05 ක් සඳහා | 2018.11.14-15 | 35,000 |
| 10 | රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන නව ප්‍රවණතා | 2018.11.16 | 72,065 |
| 11 | Project Management නිලධාරීන් 02 ක් සඳහා | 2018 | 37,000 |
| 12 | Public Procument | 2018 | 33,000 |
| 13 | office Management | 2018 | 37,500 |
| 14 | වෘත්තීය මාර්ගෝපදේශ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව | 2019 | 810,000 |
| 15 | දෙමළ භාෂා පුහුණු වැඩසටහන | 2018.08.07 - 2018.10.26 | 248,990 |
| | විදේශීය පුහුණු | | |
| 1 | Mobile App Development | 2018.05.21-2018.06.30 | 673,558 |
| 2 | WAPES සමුළුව නියෝජනය කිරීම | 2018.07.24 – 2018.07.25 | 311,727 |
| 3 | Korean Workshop | 2018.10.28- 2018.11.04 | 462,212 |
| 4 | චීනයේ පැවති සම්මන්ත්‍රණයක් සඳහා සහභාගී වීම | 05.11.2018 - 27.11.2018 | 180,315 |
| 5 | ILO Meeting Switzerland | 2018.11.13 – 2018.11.18 | 150,413 |
| 6 | ItalyWorkshop | 28.11.2018 - 02.12.2018 | 89,889 |

## 4. ගිණුම් අංශය

2018 වර්ෂයේ මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25 ක් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 316 හා ප්‍රධාන කාර්යාලයේ සේවයේ නියුක්ත නිලධාරීන් 588 ක් සඳහා මාසිකව වැටුප් ගෙවීම ඇතුලුව එම කාර්යාලයන්හි පවත්නා විවිධ වැඩසටහන් සඳහා මිලියන 28.8 ක මුදලක් බෙදා හැර ඇත.

2018 ප්‍රසම්පාදන සැලැස්ම අනුව ලැප්ටොප් 49 මිලදී ගෙන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 49 දෙනෙකුට බෙදා හැර ඇත. එමෙන්ම කුරුණෑගල, යාපනය,අම්පාර හා නුවරඑළිය රැකියා කේන්ද්‍ර සඳහා මිලියන2.8 ක මුදලක් ලබා දී ඇත.

2018 ප්‍රථම වරට ලක් රැකියා හරසර නමින් වැඩසටහනක් ආයතන හා පුද්ගල ඇගයීම් සඳහා කුරුණෑගල අම්පාර හා යාපනය දිස්ත්‍රික් කේන්ද්‍ර කරගනිමින් සිදුකරන ලදි. මේ සඳහා අමාත්‍යාංශයෙන් ලබා දුන් ප්‍රතිපාදනයෙන් මිලියන 1.8 ක් වියදම් කර ඇත.

2018 වර්ෂයේදී මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව (ශීර්ෂ අංක 328) වෙත මහා භාණ්ඩාගාරයෙන් හා අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන වියදම් කරන ලද ආකාරය පහත පරිදි වේ.

| **විස්තරය** | **ප්‍රතිපාදනය - (රු, .000)** | **වියදම -(රු, .000)** | **ඉතිරිය (රු, .000)** | **ප්‍රතිශතය (%)** |
|---|---|---|---|---|
| පුනරාවර්ථන | 352,655 | 348,649 | 3,958 | 98.89% |
| ප්‍රාග්ධන | 31,100 | 30,0395 | 704 | 97.74% |
| අමාත්‍යාංශයෙන් ලබා දුන් 193-1-2-2-2509 | 3,733 | 3,275 | 457 | 98.80% |

මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද විගණන විමසුම් සියල්ලටම මේ වනවිට පිළිතුරු ඉදිරිපත් කර ඇත විස්තර පහත පරිදි වේ.

| විගණන විමසුම ඉදිරිපත් කල ආයතනය | 2018 වර්ෂය තුල ඉදරිපත් කල සංඛ්‍යාව |
|---|---|
| රජයේ විගණන අංශය<br>(විගණකාධිපති දෙපාර්තමේන්තුව) | 06 |
| අභ්‍යන්තර විගණන අංශය<br>(මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුව) | 03 |
| අභ්‍යන්තර විගණන අංශය (කම්කරු අමාත්‍යාංශය) | 01 |

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බි ගිණුම සඳහා 2018 වර්ෂයේ පහත සඳහන් පරිදි වැය කිරීම් සිදු කර ඇත.

| ණය වර්ගය | ලබා දී ඇති සංඛ්‍යාව | ලබා දී ඇති මුදල රු. |
|---|---|---|
| ආපදා ණය | 68 | 13,114,689.06 |
| උත්සව අත්තිකාරම් | 398 | 3,980,000.00 |
| විශේෂ අත්තිකාරම් | 23 | 92,000.00 |
| එකතුව | | 17,186.689.06 |

## 5. රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය

යෞවන රැකියා අංශය ලෙස 1997 වර්ෂයේ දී යෞවන කටයුතු අමාත්‍යාංශය යටතේ ආරම්භ කර ඇති මෙම අංශය 2010 වර්ෂයේදී මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව පිහිටුවීමේදී දෙපාර්තමේන්තුව යටතට පත් කර ඇත.

වෘත්තීය මාර්ගෝපදේශ හා රැකියා නිර්මාණ, ප්‍රවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක කරන විවිධ, එකිනෙක යා වූ වැඩසටහන් මාලාවක් තුලින් සමස්ථ ශ්‍රී ලාංකික ශ්‍රම බලකාය නිසි වෘත්තීන් කෙරේ යොමු කරවීම, නව රැකියා අවස්ථාවන් නිර්මාණය කිරීම මෙන්ම ජාතික ප්‍රතිපත්ති හා පුද්ගල හැකියා හා දක්ෂතාවයන්ට අනුකූල රැකියාවන් ප්‍රවර්ධනය කිරීමත් යන පුළුල් පරාසයක පැතිරුණ කාර්යය භාරයක් ඉටු කරනු ලබයි.

මෙම කාර්යභාරය සාර්ථකව ඉටු කිරීම සඳහා අංශය ඒකක දෙකකට බෙදා ඇති අතර, ඒ ඒ ඒකකය සහකාර අධ්‍යක්ෂවරයකුගේ මග පෙන්වීම යටතේ මෙම කාර්යයන්හි නිරත වේ. ශ්‍රී ලංකාව පුරා දිස්ත්‍රික් ලේකම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට අනුයුක්ත කර ඇති වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් හා සංවර්ධන නිලධාරී මගින් මෙම වැඩසටහන් බිම් මට්ටම කරා රැගෙන යාම සිදු වේ.

**විරැකියාවෙන් පෙළෙන හා නව්‍යලෙස රැකියා වෙළඳපල වෙත ප්‍රවේශ වන හා අනාගතයේ ප්‍රවේශ වීමට නියමිත ජනතාව වෙත සේවා නියුක්ති ආශ්‍රිත පහසුකම් සැපයීමේ අරමුණින් 2018 වසරේ මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව විවිධ වැඩසටහන් පවත්වන ලදි.**

**රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශන කටයුතු**

**රැකියා නිර්මාණ**

* ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන්
* අවශ්‍යතා මත පුහුණු වැඩසටහන්
* උද්‍යාන අලංකරණය
* ස්වයං රැකියා වැඩසටහන්

**රැකියා ප්‍රවර්ධන**

* ප්‍රාදේශීය රැකියා පොළ
* රැකියා සඳහා යොමු කිරීම

**වෘත්තීය මාර්ගෝපදේශන**

* විශ්ව විද්‍යාල සිසුන් සඳහා
* පාසැල් වැඩසටහන් (උසස් පෙළ/ සාමාන්‍ය පෙළ)
* ගුරුවරුන් සඳහා
* රැකියා විරහිත තරුණ පිරිස සඳහා
* දෙමව්පියන් සඳහා
* Career Me ආයතනය සමග ඒකාබද්ධ පාසල් වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්
* හසර සඟරාව

රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටින හා නව්‍යලෙස රැකියා වෙළඳපල වෙත ප්‍රවේශ වන හා අනාගතයේ ප්‍රවේශ වීමට නියමිත ජනතාව වෙත සේවා නියුක්ති ආශ්‍රිත පහසුකම් සැපයීමේ අරමුණින් මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව විවිධ වැඩසටහන් පවත්වනු ලබයි.

සාමාන්‍ය පෙළ පාසල් සිසුන්, උසස් පෙළ පාසල් සිසුන් හා පාසල් පද්ධතියෙන් බැහැර වන සිසුන් අරඹයා වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් පැවැත්වීම සිදු කරනු ලැබේ. **Career Me ආයතනය සමග අවබෝධතා ගිවිසුමක් දෙපාර්තමේන්තුව විසින් අත්සන් කර ඇති අතර එමගින් මාර්ගගත** පෞරුෂත්ව පරීක්ෂා සඳහා විශේෂයෙන් පාසල් සිසුන් හට අවස්ථාව සැලසෙන අතර දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් එම පෞරුෂත්ව පරීක්ෂා තොරතුරු මත අවශ්‍ය වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දෙනු ලබයි.

මෙම පාසල් කණ්ඩායම් වලට අමතරව ජාතික විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිටින හා බාහිර උපාධි හදාරන සිසුන් සඳහා ද වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් වාර්ෂිකව පවත්වා ගෙන යනු ලබයි. මේ මගින් උගත් තරුණ පිරිසගේ රැකියා වියුක්තිය අවම කිරීම අරමුණු කරයි.

තවද පාසල් ගුරුවරුන් හා දෙමාපියන් වෘත්තීය වරණය පිළිබඳ දැනුවත් කිරීම් ද සිදු කරනු ලැබේ.

දෙපාර්තමේන්තුව ග්‍රාමීය ආර්ථිකය ගොඩනැංවීම තුළින් රැකියා අවස්ථා ජනිත කිරීමත් ව්‍යවසායකයින් හා ස්වයං රැකියා ලාභීන් ජනිත කිරීමටත් ක්‍රියා කරනු ලබයි. මේ මගින් ව්‍යවසායකත්වය දියුණු කිරීම මගින් ආදායම් උත්පාදන මාර්ග සඳහා තරුණ ප්‍රජාව බල ගන්වනු ලබයි.

ශ්‍රී ලංකාවේ සේවා නියුක්තියෙන් 60% ක් පමණ අවධිමත් අංශයට අයත්ය. දෙපාර්තමේන්තුව මෙහෙය වන වැඩසටහන් වන තෙදින ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන , ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන , ව්‍යවසායකත්ව අවශ්‍යතා මත පුහුණු වැඩසටහන යන වැඩසටහන් මගින් මෙම අවධිමත් අංශය සංවර්ධනය කර එය විධිමත් කරවීමට කටයුතු කරගෙන යනු ලැබේ. 2018 වසරේදී අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ අනුමැතිය සහිතව සුනිසි මෙහෙවර ප්‍රතිපාදන යොදා ගෙන විශේෂ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් හා විශේෂ අවශ්‍යතා මත පුහුණු වැඩසටහන් පවත්වන ලදි.

මෙයට අමතරව උද්‍යාන අලංකරණය , ප්‍රාදේශීය රැකියා පොළ වැඩසටහන ආදී වැඩසටහන් හා හසර සඟරාව වැනි ප්‍රකාශන සකස් කර ප්‍රකාශයට පත් කිරීම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලැබේ.

ඒ අනුව මෙම අංශයේ රාජකාරී කටයුතු ප්‍රධාන වශයෙන් ඒකකයන් 02 ක් මගින් මෙහෙය වනු ලැබේ.

- රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන ඒකකය
- වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය

## 5.1 වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය

වෘත්තීය මාර්ගෝපදේශනය ⟷ වෘත්තීය උපදේශනය ⟷ සේවා නියුක්ති උපදේශන

වෘත්තීය මාර්ගෝපදේශනය පුද්ගලයින්ගේ වෘත්තීය ජීවිතය හා එහි සංවර්ධනය සාර්ථකව කළමනාකරණය කර ගැනීම සඳහා ඉවහල් වේ. රැකියාලාභීන් තුළ ආකල්ප වර්ධනය , උත්ප්‍රේරණය සහ අවශ්‍ය දැනුම දියුණු කිරීමේ අරමුණින් දෙපාර්තමේන්තුව විසින් 2018 වසරේදී වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් පවත්වන ලදි. 2018 වසරේ ජනවාරි සිට දෙසැම්බර් අවසානය දක්වා වූ කාලය තුළ ක්ෂේත්‍රය තුළ පවත්වන ලද වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත දක්වා ඇත.

| වැඩසටහනේ නම | ඇස්තමේන්තුව රු .මිලියන | වියදම රු .මිලියන | වැඩසටහන් සංඛ්‍යාව | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | | ඉලක්ක | ප්‍රගතිය | |
| අ.පො.ස. සාමාන්‍ය පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 1.054 | 0.948 | 1865 | 2160 | 54,787 |
| අ.පො.ස. උසස් පෙළ වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන | 1.105 | 0.991 | 1328 | 1402 | 37,546 |
| ස්වයං රැකියා පෙළඹවීම් වැඩසටහන | 0.947 | 0.804 | 311 | 384 | 11,545 |
| වෘත්තීය අභියෝග ජය ගැනීම | 0.794 | 0.679 | 150 | 149 | 4,655 |
| උපාධි අපේක්ෂිතයින් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන ( අභ්‍යන්තර/ බාහිර ) | 0.739 | 0.684 | 20 | 20 | 789 |
| ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන | 0.637 | 0.601 | 23 | 25 | 1,002 |
| දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන | 0.959 | 0.794 | 300 | 348 | 19,534 |
| හසර සඟරාව මුද්‍රණය | 0.300 | 0.159 | 2 | 1 | - |
| **එකතුව** | **6.535** | **5.66** | **3999** | **4489** | **129,858** |

### 5.1.1. හසර සඟරාව

හසර වෘත්තීය මාර්ගෝපදේශ හා අධ්‍යාපනික ප්‍රකාශය වසර 2000 සිට දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන අතර මෙම විෂය පිළිබඳව සිංහල භාෂාවෙන් පළ කරනු ලබන ප්‍රථම සඟරාව ද වේ. මෙම සඟරාව පාසල්, විශ්වවිද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන, නගර සභා මඟින් පාලනය වන පුස්තකාල සඳහා නොමිලේ නිකුත් කරනු ලැබේ. සඟරාව සඳහා අන්තර්ගත වන ලිපි සකස් කිරීම දෙපාර්තමේන්තුවේ එම විෂය පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත් නිලධාරීන්ගෙන් හා වෘත්තීය මාර්ගෝපදේශ විෂයේ ප්‍රවීණයන් හා සම්මුඛ සාකච්ඡා පැවැත්වීම තුලින් සිදු වේ. දෙපාර්තමේන්තුවේ කාර්යභාරයත් සමඟ පහත විෂයන් සම්බන්ධයෙන් ලිපි පළ කිරීමේදී විශේෂ අවධානයක් යොමු කරනු ලැබේ.

I. වෘත්තීය මාර්ගෝපදේශය විෂයට අදාළ ලිපි
II. රැකියා ලෝකයේ නව ප්‍රවණතා
III. වෘත්තීය මාවත් හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර
IV. සාර්ථක වෘත්තිකයෙකු ලෙස රටේ කීර්තිනාමයක් සහිත පුද්ගලයන් සමඟ සම්මුඛ සාකච්ඡා ඇසුරින් සකස් කළ ලිපි
V. පාසල් සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීමට අදාළ ලිපි

## 5.2 රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන වැඩසටහන්හි භෞතික හා මූල්‍ය ප්‍රගතිය

2018 වසරේ ජනවාරි සිට දෙසැම්බර් අවසානය දක්වා වූ කාලය තුළ ක්ෂේත්‍රය තුළ පවත්වන ලද රැකියා නිර්මාණ ප්‍රවර්ධන වැඩසටහන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත දක්වා ඇත.

| වැඩසටහනේ නම | ඇස්තමේන්තුව රු .මිලියන | වියදම රු .මිලියන | වැඩසටහන් සංඛ්‍යාව | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | | ඉලක්ක | ප්‍රගතිය | |
| ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන | 0.541 | 0.515 | 25 | 36 | 1,145 |
| උද්‍යාන අලංකරණ වැඩසටහන | 0.105 | 0.097 | 3 | 3 | 123 |
| අවශ්‍යතා මත පුහුණු වැඩසටහන | 1.687 | 1.559 | 240 | 288 | 9,773 |
| ප්‍රාදේශීය රැකියා පොළ වැඩසටහන | 0.458 | 0.462 | 48 | 77 | 7,602 |
| එකතුව | **2.791** | **2.633** | **316** | **404** | **18,643** |

**5.3 රැකියා නිර්මාණ , ප්‍රවර්ධන හා වෘත්තීය මාර්ගෝපදේශ අංශය මගින් පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන්හි ලබා ගන්නා ලද ඡායාරූප**





ව්‍යවසායකත්ව වැඩසටහන හිඟුරක්ගොඩ -2018/06/20-2018/06/22







රැකියා අපේක්ෂිතයන්දැනුවත් කිරීමේ වැඩසටහන -2018/11/26 -වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය





අ - පො.ස උසස් පෙළ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන.2018/11/26 -වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## මිනිස්බල සැලසුම් සංවර්ධන හා පර්යේෂණ අංශය

මෙම අංශය ප්‍රධාන ඒකක 03 ක් යටතේ ක්‍රියාත්මක වේ

- ☆ ශ්‍රම වෙළඳ පොළ තොරතුරු ඒකකය
- ☆ රැකියා කේන්ද්‍රය
- ☆ ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්ති මෙහෙයුම් ඒකකය

ජාත්‍යන්තර ශ්‍රම වෙළඳපොළ ජාලයේ ශ්‍රී ලාංකික කොටස්කරුවා වශයෙන් කාර්යක්ෂම හා ඵලදායි තීරණ ගැනීම සඳහාත්,ප්‍රතිපත්ති සම්පාදන කාර්යය සඳහාත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ අධ්‍යාපන වැඩසටහන් , පුහුණු හා කුසලතා සංවර්ධන වැඩසටහන් සම්පාදකයින් සඳහාත් අවශ්‍ය ශ්‍රම වෙළඳපොළ තොරතුරු භාවිතයට පහසු වන ආකාරයෙන් සියළු පාර්ශවකරුවන් වෙත සම්පාදනය කර දීම උදෙසා බිහි කරන ලද අංශයයි.

ශ්‍රම වෙළඳපොළ තොරතුරු රැස් කිරීමේ දී සීඝ්‍රව වෙනස් වන කුසලතා සපිරි මානව සම්පත සඳහා ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම මනාව අධීක්ෂණය කිරීම හා තක්සේරු කිරීම අත්‍යවශ්‍ය වේ.මිනිස්බල සැලසුම්,සංවර්ධන හා පර්යේෂණ අංශය මඟින් ශ්‍රම වෙළඳපොළ තොරතුරු රැස්කිරීම,විශ්ලේෂණය කිරීම හා බෙදා හැරීම සිදු කරනු ලබයි.

එමෙන් ම ලංකාවේ කාලීන හා සංවර්ධන අවශ්‍යතාවන්ට සරිලන ලෙස ශ්‍රම වෙළඳපොළ පර්යේෂණ හා සමීක්ෂණ පැවැත්වීම,ශ්‍රම ඉල්ලුම හා සැපයුම පිළිබඳ අධ්‍යයනය සිදු කිරීම හා එම තොරතුරු බෙදා හැරීම ශ්‍රම වෙළඳපොළ තොරතුර ඒකකයෙන් සිදු කරනු ලැබේ.

### *ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකය*

**2018 වර්ෂයේ ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකය මඟින් යෝජිත වූ වැඩ සටහන්**

ශ්‍රී ලංකාවේ තරුණ පිරිස් අතර ප්‍රබල ගැටළුවක් බවට පත් වී ඇත්තේ විරැකියාවයි.බොහෝ තරුණ පිරිස් උසස් අධ්‍යාපනයට යොමු වී එය නිම කළ ද වාර්ෂිකව ශ්‍රම වෙළඳපොළට එකතු වන ශ්‍රම බලකාය ඉතා ඉහළ අගයක් ගනී.ශ්‍රී ලංකාවේ තරුණ පිරිස් විරැකියාවෙන් පෙළීමට මූලික හේතුව වී ඇත්තේ ශ්‍රම වෙළඳපොළ පවතින රැකියා අවස්ථාවන් පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ දුෂ්කරතාවයන්ය.මෙම තොරතුරු විෂමතාවයන්ට පිළියම් වශයෙන් ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍රයන්හි පවතින රැකියා අවස්ථා අධ්‍යයනය කර ඒ පිළිබඳ තොරතුරු රැකියා අපේක්ෂිතයින් වෙත ලබා දෙනු ලැබේ.

**01. මැන් පවර් සේවකයින් පිළිබඳ සමීක්ෂණය**

පෞද්ගලික අංශයේ මෙන් ම රාජ්‍ය අංශයේ ද රැකියා සඳහා මැන්පවර් සේවකයින් යොදා ගැනීම වර්තමානය වන විට බහුලව දක්නට ලැබේ.මෙම සේවකයින් සඳහා පත්වීම් ලිපියක් ,රැකියා අයිතිවාසිකම් හෝ කිසිදු සමාජ ආරක්ෂණයක් නොලැබෙන තත්වයක් තුළ ඔවුන්ට පවත්නා සේවා ගැටළු හා ඒවාට විසඳුම් යෝජනා කිරීම සඳහා මෙම අධ්‍යයනය සිදු කරන ලදී.මේසඳහාමැන්පවර් සේවකයින් 132 ක් තෝරාගෙන ප්‍රශ්නාවලියක් ලබා දීම තුළින් පහත දැක්වෙන තොරතුරු ලබා ගන්නා ලදී.

- ➢ වර්තමාන මැන්පවර් සේවකයින්ගේ ප්‍රජා විද්‍යාත්මක ලක්ෂණ .
  (වයස් සංයුතිය,කුසලතා,පවුල් සංයුතිය)
- ➢ රැකියාවේ ස්වභාවය (ස්ථිර/තාවකාලික/අනියම් )
- ➢ රැකියාවේ තත්වයන් සලකා බැලීම (EPF/ETF දායකත්වය,හදිස්සි අනතුරු රක්ෂණාවරණය)

මෙම සමීක්ෂණය මඟින් පහත දැක්වෙන නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

- ➢ මැන්පවර් සේවකයින්ගේ වැඩකරන පරිසරයේ තත්වය වැඩි දියුණු කිරීමට නව නීති සකස් කිරීම.
- ➢ මැන්පවර් සේවකයින්ගේ සමාජ සුරක්ෂිතභාවය වැඩි දියුණු කිරීම.
- ➢ මැන්පවර් සේවකයින් වශයෙන් වැඩ කරන සේවකයන්ට රැකියාව හා සමාජ නීතිමය පසුබිම පිළිබඳ දැනුවත් භාවයක් ලබා දීම.
- ➢ මැන්පවර් ආයතන පිහිටුවීමේ දී එම රැකියා වලට බඳවා ගැනීමේ නීති රීති විධිමත් කිරීම.

**02. ශ්‍රී ලංකාවේ කුලී රථ කර්මාන්තයේ මානව සම්පත් උපයෝජනය පිළිබඳ සමීක්ෂණය**

කුලී රථ කර්මාන්තය සුවපහසු හා කාර්යක්ෂම ප්‍රවාහන මාධ්‍යක් ලෙස වැඩි දියුණු වීමත් සමඟ ලංකාවේ කුලී රථ ප්‍රමාණය ක්‍රමයෙන් වැඩිවෙමින් පවතී. ක්‍රමයෙන් වැඩිදියුණුවන කර්මාන්තයක් තුලින් ශ්‍රම වෙළඳපොළට එකතුවන රැකියා අවස්ථාවන් වැඩි විය යුතුය. කුලී රථ කර්මාන්තයේ රැකියා අවස්ථාවන් පිළිබඳව අධ්‍යයනය කිරීම සහ එම රැකියා අවස්ථාවන් සඳහා යොමු වීමට අවශ්‍ය නිපුණතාවන් හා සුදුසුකම් සකස් කර ගත යුතු ආකාරය පිළිබඳව මෙමගින් අධ්‍යනය කිරීමට අපේක්ෂිතය.මෙම සමීක්ෂණය මඟින් පහත දැක්වෙන යෝජනා ඉදිරිපත් කරන ලදී.

- කුලීරථ සේවාව සඳහා තාක්ෂණය භාවිතය නාගරික මෙන්ම ග්‍රාමීය මට්ටමින් දියුණු කිරීම මෙන්ම කුලී රථ සේවාව තුළ ඒකාධිකාරියක් ඇති වීම වැලැක්වීම සඳහා දේශීය කුඩා ව්‍යාපාරිකයන් දැනුවත් කිරීම සහ දිරි ගැන්වීම් කල යුතුය.
- පොදු ප්‍රවාහනයේ ඇති දුෂ්කරතා හේතුවෙන් කාර්යක්ෂම සේවාවක් සලසා ගැනීම සඳහා කුලී රථවලට මහජනයා යොමු වුවද, එහි අතුරු ප්‍රතිඵලයක් වන්නේ මාර්ග අවහිරතා ඇති වීමය. එවැනි අර්බුදයකට පෙර අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතු වේ.
- නවීන තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් සිදුකරන කුලී රථ සේවාව මෙන්ම මීටර් සවිකර ඇති කුලී රථ සේවා සඳහා ද නිශ්චිත මිල පාලනයක් සහිතව ප්‍රමිතීන් සකස් කළයුතු වේ.

**03. රාජ්‍ය අංශයේ රැකියා පැතිකඩ-2018 (II වන කොටස)**

රාජ්‍ය අංශයේ රැකියා සඳහා ඉහළ අභිරුචියක් සියලුම ප්‍රජාවන් අතර, විශේෂයෙන්ම උගත් තරුණ පිරිස අතර දැකිය හැකිය. කෙසේ වෙතත්, එවැනි අපේක්ෂකයින් බොහෝ දෙනෙක් රාජ්‍ය අංශයේ රැකියා සඳහා අවශ්‍ය මූලික පිවිසුම් අවශ්‍යතා/සුදුසුකම් නොදනී.රාජ්‍ය අංශයේ අනවශ්‍ය රැකියා තදබදය මෙහි ප්‍රතිඵලයකි.

ඉහත තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ රැකියා පැතිකඩ පළවෙනි වෙළුම 2017 වර්ෂයේ මුද්‍රණය කරන ලද අතර එහි දෙවන වෙළුම මඟින් තවත් රාජ්‍ය අංශයේ ආයතන කිහිපයක තනතුරු පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරනු ලබයි. මේ සඳහා රාජ්‍ය අංශයේ ළමා හා කාන්තා කටයුතු අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා ආයුර්වේද දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වාරිමාර්ග දෙපාර්තමේන්තුව ,ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුව , ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව ,ශ්‍රී ලංකා සංස්කෘතික දෙපාර්තමේන්තුව ,ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව ,ශ්‍රී ලංකා ඉඩම් දෙපාර්තමේන්තුව ,ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු වලින් ප්‍රශ්නාවලියක් මඟින් හා බඳවා ගැනීමේ පටිපාටි මඟින් තොරතුරු රැස් කර සකස් කරන ලදී.

**04. ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඇතුළත් DVD තැටි සකස් කිරීම.**

මෙම දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍රගත නිලධාරීන් සඳහා ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ පිළිබඳ යාවත්කාලීන තොරතුරු ලබා දීම අත්‍යවශ්‍ය වුව ද එම තොරතුරු ලබා ගැනීමේ විවිධ අපහසුතා පැවතීම හා ඇතැම් නිලධාරීන් ශ්‍රම වෙළඳපොළ යාවත්කාලීන තොරතුරු පිළිබඳ නොදැනුවත්කම නිසා ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඇතුළත් DVD තැටි සකස් කිරීමට තීරණය කරන ලදී.සංයුක්ත තැටි 570 ක් සකස් කර ප්‍රධාන කාර්යාල නිලධාරීන් ,ප්‍රාදේශීය හා දිස්ත්‍රික් කාර්යාල වල වෘත්තීය මාර්ගෝපදේශන නිලධාරීන්, මානව සම්පත් සංවර්ධන නිලධාරීන් වෙත ලබා දෙන ලදී.

**05. සමාජ ආර්ථික දත්ත අත්පොත**

පාසල් අධ්‍යාපනයේ කඩඉම් ජය ගැනීමට හා ඉන් අනතුරුව උසස් අධ්‍යාපනය කරා යාමට වෙර දරන දරුවන්ට අත්වැලක් වීමටත් ඒ හා සමගාමීව දේශීය හා විදේශීය සමාජීය ආර්ථික ප්‍රවණතා විශේෂයෙන්ම ශ්‍රම වෙළඳපොළ පිළිබඳ මූලික අවබෝධයක් ලබාදීමත් අරමුණු කරගෙන වාර්ෂිකව සමාජ ආර්ථික දත්ත අත්පොත ප්‍රකාශයට පත්කරනු ලැබේ. මෙම ග්‍රන්ථය ප්‍රකාශයට පත් කරන ලදුව,දිස්ත්‍රික් ලේකම් කාර්යාල මඟින් දිවයින පුරා පාසල් 7674 වෙත බෙදා හැරීමට කටයුතු කර ඇත.

### 06. ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් ඇති කිරීම පිළිබඳ සමුළුව (LMIS Forum)

ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ තොරතුරු එක්රැස් කිරීම සඳහා ඒකාබද්ධ තොරතුරු පද්ධතියක් නොමැති නිසා විවිධ පාර්ශවයන් විසින් විවිධ අධ්‍යයනයන් හා සමීක්ෂණ සිදු කිරීම,එම දත්ත අතර සමානරූපී බවක් නොමැති වීම ආදී හේතූන් නිසා ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒවා අවශ්‍ය පුද්ගලයින්ට පහසුවෙන් ලබා දීම පිළිබඳ අවශ්‍යතාවය හඳුනා ගනිමින් ඒකාබද්ධ තොරතුරු පද්ධතියක් සම්පාදනය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය සහ අප අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව සමුළුවක් පවත්වන ලදී.ඒ සඳහා අප අමාත්‍යාංශ ලේකම්තුමා,ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම්තුමා,ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂතුමා,අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්තුමා,ජාතික මානව සම්පත් සංවර්ධන උපදේශන ආයතනයේ සභාපතිතුමා,ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා,තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්තුමා,ලංකා සේවා සංගමයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු පිරිසකගේ සහභාගීත්වයෙන් මෙම සංවාද සමුළුව පැවැත් විය.

මෙම සමුළුව මඟින් පහත සඳහන් කරුණු හඳුනා ගන්නා ලදී.

- ශ්‍රම වෙළඳපොළ තොරතුරු රැස් කිරීම විශ්ලේෂණය කිරීම හා බෙදා හැරීම පිළිබඳ පාර්ශවකරුවන් හඳුනා ගැනීම.
- එම පාර්ශවකරුවන් අතර සංවාදයක් තුළින්අදාළ තොරතුරු රැස් කිරීම හා විශ්ලේෂණය සම්බන්ධ ක්‍රමවේදයක් හා ප්‍රතිපත්ති රාමුවක් සැකසීම.
- ශ්‍රම වෙළඳපොළ තොරතුරු දැනට රැස් කරන තොරතුරු හා ඌණතා පිළිබඳ හඳුනා ගැනීම.

### 07. ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතිය සංවර්ධනය

මාර්ගගත Online රැකියා ගැළපීම,වෘත්තීය මාර්ගෝපදේශනය සහ පුහුණු කිරීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් මාර්ගගත රැකියා සේවා පද්ධතියක් පවත්වාගෙන යන අතර ඉන් රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් අතර ඉහළ දායකත්වයක් පවතින සේවා වියුක්තිය අවම කිරීම බලාපොරොත්තු වේ.

2018 වර්ෂය තුළ මෙම මාර්ගගත පද්ධතිය යාවත්කාලීන කිරීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍යමය දායකත්වය යටතේ,විශේෂ ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද අතර මේ වනවිට යාවත්කාලීන කරන ලද රැකියා සේවා පද්ධතිය ICTA ආයතනය මඟින් පවත්වාගෙන යන LankaGovernment Cloud හි ස්ථාපිත කොට ක්‍රියාත්මක කරනු ලැබේ.

### 08. රාජ්‍ය අංශයේ රැකියා පැතිකඩ-2017 (I වන කොටස)

මෙම පැතිකඩ 2017 වර්ෂයේ දී ඉංග්‍රිසි භාෂාවෙන් මුද්‍රණය කරන ලද අතර එයදෙමළ සහ සිංහල භාෂාවට පරිවර්තනය කර වෙබ් අඩවියේ පළ කරන ලදී.

### 09. ධීවර ක්ෂේත්‍රයේ රැකියා පැතිකඩ-2017

මෙම පැතිකඩ 2017 වර්ෂයේ දී සිංහල භාෂාවෙන් මුද්‍රණය කරන ලද අතර එය දෙමළ භාෂාවට පරිවර්තනය කර වෙබ් අඩවියේ පළ කරන ලදී.

## *ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිමෙහෙයුම් ඒකකය*

ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය 2012 වසරේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදි. මෙම ජාතික ප්‍රතිපත්තිය එවක ජොෂ්ඨ අමාත්‍ය මණ්ඩල ලේකම් කාර්යාලයෙහි මෙහෙය වීම මත හා ජාත්‍යන්තර කම්කරු සංවිධානය මගින් තාක්ෂණික හා මූල්‍ය දායකත්වය මත සම්පාදනය කරන ලදි. ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය යනු ශ්‍රී ලංකාවේ මානව සම්පත් සංවර්ධන කටයුතුද, ශ්‍රී ලාංකිකයන් වෙත පූර්ණ සුනිසි හා ඵලදායි රැකියා සැපයීමට රජය විසින් ගනු ලබන ක්‍රියා මාර්ගද පාලනය කරන්නා වූ, පරිපූර්ණ ප්‍රතිපත්ති රාමුව වේ.සමස්ථ රාජ්‍ය ප්‍රතිපත්තිය මත පදනම්ව මෙම ප්‍රතිපත්තිය සකස් කර ඇත.

**2018 වර්ෂයට සිදු කිරීමට යෝජිත වූ කාර්යයන්**

- ශ්‍රී ලංකා ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාල අමාත්‍යාංශ වලින් සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම ගෙන්වා ගැනීම.
- ප්‍රතිපත්තියට අදලව තොරතුරු තාක්ෂණ මෙහෙයුම් පද්ධතිය ස්ථාපිත කිරිම.
- ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ වන පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය කිරිම.
- ප්‍රතිපත්තියට සම්බන්ධිත ආයතන වල සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා පුහුණු අවස්ථා සම්පාදනය.
- ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වර්ෂය මැද සහ අවසානයේ ප්‍රගති වාර්තා අදාළ පාර්ශවකරුවන් වෙතින් ලබා ගෙන සමස්ත ප්‍රගති වාර්තා සම්පාදනය.

**2018 වසරේ ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්ති මෙහෙයුම් ඒකකය කළ වැඩසටහන්**

(01) 2018 වර්ෂයේ අමාත්‍යාංශ සංයුතිය අනුව එක් එක් අමාත්‍යාංශ වෙතින් මෙම ජාතික ප්‍රතිපත්තියට අදාල 2018-2020 මධ්‍යකාලීන ක්‍රියාකාරී සැලැස්ම ලබා ගැනීම සඳහා දැනුවත් කිරීම් ලිපි අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත යොමු කිරීම හා අදාල ප්‍රතිපත්තියට අනුව 2018 - 2020 සඳහා ක්‍රියාකාරී සැලැස්ම සම්පාදනය කිරිම සඳහා දැනුවත් කිරීම.

(02) ඒ අනුව, අමාත්‍යාංශ 10 ක් වෙතින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ඉදිරිපත් කරන ලද අතර 2017 වර්ෂය තුල ඉදිරිපත් ව තිබූ ලේඛන ද ඇතුලත්ව අමාත්‍යාංශ 25 ක් ආවරණය වන පරිදි සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම සම්පාදනය කිරිමට කටයුතු කරන ලදි.

(03) 2012 වර්ෂයේදී සම්පාදිත මෙම ප්‍රතිපත්තිය එවකට පැවති රජයේ ආර්ථික ප්‍රතිපත්තියට අනුගත වන පරිදි 2017 වර්ෂයේ දී සංශෝධනය කරන ලද අතර වර්තමාන සමාජ ආර්ථික ප්‍රවණතා සැලකීමට ගෙන එම ප්‍රතිපත්තියෙහි පූර්ණ සමාලෝචනයක් සිදු කිරීමට යෝජිතය.


**2018 වර්ෂයේ ශ්‍රම වෙළඳපොළ තොරතුරු ඒකකය මඟින් කළ වැඩ සටහන්,ප්‍රගතිය සහ මූල්‍ය සාරාංශය**

| අනු අංකය | යෝජිත වූ කාර්යයන් | කළ වැඩසටහන් | ප්‍රගතිය | මූල්‍ය සාරාංශය (රු:) | |
|---|---|---|---|---|---|
| | | | | වෙන් කළ මුදල | වැය කළ මුදල |
| 01 | මැන් පවර් සේවකයින් පිළිබඳ සමීක්ෂණය | අවසන් වාර්තාව සැකසීම 2019 වර්ෂයේ මාර්තු මස සිදු කරනු ලැබේ. | 75% | 500,000.00 | 340,555.00 |
| 02 | ශ්‍රී ලංකාවේ කුලී රථ කර්මාන්තයේ මානව සම්පත් උපයෝජනය පිළිබඳ සමීක්ෂණය | අවසන් වාර්තාව සැකසීම 2019 වර්ෂයේ ජනවාරි මස සිදු කර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරන ලදී. | 75% | 25,000.00 | - |
| 03 | රාජ්‍ය අංශයේ රැකියා පැතිකඩ-2017 (I වන කොටස දෙමළ සහ සිංහල භාෂාවට පරිවර්තනය කිරීම) | පරිවර්තනය සිදු කර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරන ලදී. | 100% | 94,580.00 | 94,580.00 |
| 04 | ධීවර ක්ෂේත්‍රයේ රැකියා පැතිකඩ-2017 (දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම) | පරිවර්තනය සිදු කර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරන ලදී. | 100% | 50,405.00 | 50,405.00 |
| 05 | රාජ්‍ය අංශයේ රැකියා පැතිකඩ-2017 (II වන කොටස) | පොත් 1000 ක් මුද්‍රණය කර බෙදා හරිමින් පවතී | 100% | 175,000.00 | 190,000.00 |
| 06 | ස්වයං රැකියා පිළිබඳ වැඩිදුර වාර්තාවක් සකස් කිරීම. | අවසන් වාර්තාව සකස් කර දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ පළ කරන ලදී. | 100% | - | - |
| 07 | ශ්‍රම වෙළඳපොළ තොරතුරු CD | CD 570 ක් සකස් කර බෙදා හැර අවසන් කරන ලදී. | 100% | 100,000.00 | 82,650.00 |
| 08 | ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතියක් ඇති කිරීම පිළිබඳ සමුළුව (LMI Forum) | සමුළුව පවත්වා වාර්තාවක් සකස් කරන ලදී | 100% | 822,365.00 | 744,836.00 |
| 09 | සමාජ ආර්ථික දත්ත අත්පොත | සිංහල භාෂාවෙන් පොත් 5995 ක් හා දෙමළ භාෂාවෙන් පොත් 2096 ක් මුද්‍රණය කර බෙදා හරිමින් පවතී. | 100% | 750,000.00 | 722,781.00 |
| 10 | ශ්‍රම වෙළඳපොළ තොරතුරු පද්ධතිය සංවර්ධනය | යෝජිත අතුරු සංවර්ධන කටයුත්තට අදාළ සියළුම කාර්යයන් (Requirements) සිදු කොට අවසන් කරන ලදී.එය වෙබ් අඩවියෙහි යාවත්කාලීන කර ඇත. | 90% | 500,000.00 | 515,470.00 |
| | II Design and Development of Mobile Application | මෙහි ගිවිසුමට අදාළව මාස 06ක කාල සීමාවක් තුළ දී සම්පූර්ණ පැවරුම අවසන් කිරීමට නියමිත වේ.ඒ අනුව දැනට Mobile App හි Freelancer සහ Freelancer Seeker යන අංශ ඉටු කර අවසන් කර ඇත. | | | |

## 6.3 රැකියා කේන්ද්‍රය

මෙම අංශය මිනිස්බල සැලසුම්,සංවර්ධන හා පර්යේෂණ අංශය යටතේ ක්‍රියාත්මක වේ. දිවයිනේ දිස්ත්‍රික්ක 25ක මෙම රැකියා කේන්ද්‍රය (Job Center /PES) ක්‍රියාත්මක වේ.ප්‍රධාන රැකියා කේන්ද්‍රය බත්තරමුල්ල කාර්යාල පරිශ්‍රයෙහි ස්ථාපිත කර ඇත.

රැකියා කේන්ද්‍ර ජාලය








ප්‍රධාන කාර්යාලය
9 වන මහල
සෙත්සිරිපාය දෙවන අදියර
බත්තරමුල්ල

දිස්ත්‍රික් රැකියා කේන්ද්‍රය මගින් සිදු කරනු ලබන කාර්යයන් වන්නේ ,

- රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම.
- පුරප්පාඩු සහ ආයතන ලියාපදිංචි කිරීම.





- ආයතනවල පුරප්පාඩු සොයා බැලීම සඳහා කටයුතු කිරීම.
- රැකියා අපේක්ෂිතයින්ගේ රැකියා පුරප්පාඩු පිළිබඳ ලේඛණ සකස් කිරීම.
- සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම හා රැකියා අපේක්ෂිතයින්ගේ සුදුසුකම් තහවුරු කර ගැනීම.
- රැකියා ගැලපීම් හා සම්මුඛ පරීක්ෂණ සඳහා යොමුකිරීම.

- රැකියා ගතකිරීම් හා පසුවිපරම්
- වෘත්තීය මාර්ගෝපදේශන සේවාවන් සැපයීම.
- පුහුණුව සඳහා පහසුකම් සැපයීම.
- රැකියා තත්ත්වයන් පිළිබඳව සංඛ්‍යා ලේඛණ රැස්කිරීම හා ප්‍රකාශයට පත් කිරීම.
- විදේශීය රැකියා අවස්ථා සඳහා මඟපෙන්වීම.
- දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහන සංවිධානය කර පැවැත්වීම.




රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම ක්‍රම කිහිපයකට සිදුවේ. ප්‍රාදේශීය මට්ටමේ මානව සම්පත් සංවර්ධන සහකාරවරුන් විසින් හා රැකියා පොළවල්, රැකියා කේන්ද්‍ර මධ්‍යස්ථාන හරහා ලබා දෙන තොරතුරු මඟින් මෙම තොරතුරු ලබා ගැනේ.මේ යටතේ රැකියා අපේක්ෂිතයන් දැනුවත් කිරීමේ මූලික වැඩසටහන් සංවිධානය කෙරේ.

දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට මාර්ගගත (online) රැකියා සේවා සැපයීමේ අන්තර්ජාල බිහිදොර මගින්ද රැකියා අපේක්ෂිතයන්ට හා ලියාපදිංචි විය හැකි අතර සේවා යෝජකයන් හටද මෙහි ලියාපදිංචි වී තම අවශ්‍යතා අනුව පුරප්පාඩු සඳහා රැකියා අපේක්ෂිතයන් තෝරා ගත හැක.

එසේම රැකියා අපේක්ෂිතයන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය,පුහුණුව සඳහා යොමු කිරීම , Career Me ආයතනය විසින් පහසුකම් සපයන පෞරුෂත්ව සඳහා නොමිලේ පෙනී සිටීමට අවශ්‍ය පහසුකම් සපයා ඇත.මෙයට අමතරව විවිධ නිපුනතාවයක් සහිත වෘත්තකයන් සඳහා සිය සේවාවන් දෙපාර්තමේන්තු අන්තර්ජාල බිහිදොර මගින් ලියාපදිංචි වී ලබා දීමටත් එම සේවා අවශ්‍ය පිරිස සඳහා අන්තර්ජාලය මගින් තම පදිංචි ප්‍රදේශ අනුව සේවා සපයන්නන් තෝරා ගැනීමටත් අවස්ථාව සලසා ඇත.ඉහත දැක්වූ මෙම සේවා ජංගම දුරකථන ආශ්‍රිත යෙදවුමක් (Mobile App.) මගින් ලබා ගැනීමටත් හැකියාව ඇතිවන පරිදි මෘදුකාංග සංවර්ධනය කර ඇත.උක්ත දෙපාර්තමේන්තු වෙබ් අඩවිය හා ඒ ආශ්‍රිත සංවර්ධනය පිළිබඳ කෙටි ව්‍යාපෘති දෙකක් සඳහා ලෝක කම්කරු සංවිධානය (ILO) මගින් අනුග්‍රහය දක්වා ඇත.

## වැඩසටහන් සාරාංශය - ජාතික රැකියා කේන්ද්‍රය

01. රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීමේ වැඩසටහන

අරමුණ : ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ලියාපදිංචි වී සිටින රැකියා අපේක්ෂිතයින්ව දැනුවත් කිරීම මගින් ඔවුන් කැමති රැකියා ක්ෂේත්‍රය හඳුනාගැනීම හෝ අවශ්‍ය පුහුණු/උපදේශනවලට යොමුකිරීම.

02. දිස්ත්‍රික් රැකියාපොළ වැඩසටහන

දිස්ත්‍රික්කය තුළ සිටින රැකියා අපේක්ෂිතයන් වෙනුවෙන් සංවිධානය කළ යුතු මෙම වැඩසටහන හරහා රැකියා සපයන ආයතන හා රැකියා අපේක්ෂිතයින් එකම ස්ථානයක දී හමුවීමට ඉඩහැරීම තුළින් සුදුසු රැකියා අවස්ථා හඳුනාගැනීමටත් , සුදුසුකම් සපිරිණු තරුණ පිරිස් ආකර්ශනය කර ගැනීමටත් මහ පාදාදෙනු ඇත.

1. බදුල්ල රැකියා පොල 2018.10.22 -










2. කඩුවෙල ප්‍රාදේශීය රැකියා පොළ වැඩසටහන - 2018.11.02










03. ව්‍යාපාරික සමුළු

දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර මූලික කරගනිමින් කරගෙන එම දිස්ත්‍රික් වල සේවා යෝජකයන්ගේ සමුළු සංවිධානය කර දෙපාර්තමේන්තුවේ සේවාවන් හඳුන්වා දීමේ වැඩසටහනකි. ඒ අනුව 2018 වර්ෂය සඳහා අම්පාර ,කළුතර, කොළඹ, යාපනය , ගම්පහ,මාතර සහ රත්නපුර යන දිස්ත්‍රික්කයන්හිදී මෙම වැඩසටහන පවත්වන ලදී. ඊට අමතරව ආයෝජන ප්‍රවර්ධන කලාප මූලික කරගෙන එම කලාපවල ස්ථාපිත කර ඇති ව්‍යාපාරික ආයතන සඳහා ද දෙපාර්තමේන්තුවේ සේවාවන් හඳුන්වා දීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව 2018 වර්ෂයේදී බියගම , කටුනායක පල්ලේකැලේ සහ වතුපිටිවල යන ආයෝජන ප්‍රවර්ධන කලාපවල ව්‍යාපාරික සමුළු පවත්වන ලදී.

**04.විශේෂ වැඩසටහන්**

I. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය අතර අවබෝධතා ගිවිසුමක් 2018.09.12 දින අත්සන් කරන ලදී.



II. කම්කරු හා රැකී රක්ෂා ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා උපදේශනාත්මක වැඩසටහන සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකාව සහ දකුණු කොරියාව අතර 2018.08.02 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් තබන ලදී .

III. එමෙන්ම අප දෙපාර්තමේන්තුව විසින් මහජන රැකියා සේවා සඳහා වන අන්තර්ජාතික සංවිධානයේ ශ්‍රී ලාංකික සමාජිකත්වය ලබා ගන්නා ලදී.(World Association Public Employment Service)

2018 වර්ෂයේදී දිස්ත්‍රික් රැකියා සේවා මධ්‍යස්ථාන මහජනතාවට ඉතා කාර්යක්ෂම සේවාවක් සැපයීමේ අරමුණින් ප්‍රතිනාමකරණය සිදු කරන ලදී.ඒ අනුව සෑම දිස්ත්‍රික් මධ්‍යස්ථානයක්ම රැකියා කේන්ද්‍රය යන නාමය යටතේ ප්‍රතිව්‍යුගත කිරීම සිදු කරමින් පවතී. මේ යටතේ අම්පාර ,යාපනය , කුරුණෑගල හා නුවරඑළිය යන දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර ප්‍රතිස්ථාපනය කරන ලදී.

01. **“අම්පාර රැකියා කේන්ද්‍රය”අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයදී 2018.08.16 දින විවෘත කරන ලදී.**










02. **“යාපනය රැකියා කේන්ද්‍රය”යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය** දී 2018.09.07 දින විවෘත කරන ලදී.










03. “කුරුණෑගල රැකියා කේන්ද්‍රය ”කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය දී **2018.08.06** විවෘත කරන ලදී.





04. නුවරඑළිය රැකියා කේන්ද්‍රය  නුවරඑළිය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය  දී **2019.01.02** දින විවෘත කරන ලදී.




## 6.3 රැකියා කේන්ද්‍රයේ ප්‍රගතිය

| | වැඩසටහන/ක්‍රියාකාරකම | 2018 වසර සඳහා වූ ඉලක්ක | | 2018/01/01 දින සිට 2018/12/31 දක්වා ප්‍රගතිය | | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍ය (රු.මි) | භෞතික | මූල්‍ය (රු.මි) | |
| | **රැකියා කේන්ද්‍රය** | | | | | |
| 01 | දිස්ත්‍රික් රැකියාකේන්ද්‍ර මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම හා ආරම්භ කිරීම | 4 | 2.750 | 4 | 3.169 | - |
| 02 | දිස්ත්‍රික්රැකියා පොළ පැවැත්වීම | 7 | 1.000 | 7 | 1.267 | 6615 |
| 03 | රැකියාඅපේක්ෂිතයන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 150 | 0.750 | 197 | 0.715 | 7597 |
| 04 | WAPES Membership -ලෝක මහජන රැකියා සේවා සංගමය | 100% | 0.500 | | 0.311 | - |
| 05 | දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර පවත්වාගෙන යාම | 100% | 1.354 | 100% | 1.374 | |
| 06 | රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීම (ප්‍රතිලාභීන්) | 371908 | | 121016 | | |
| 07 | රැකියා පුරප්පාඩු ලියාපදිංචි කිරීම | 35402 | | 31933 | | |
| 08 | රැකියා ගැලපීම | | | 27546 | | |
| 09 | රැකියා ගත කිරීම (ප්‍රතිලාභීන්) | 24097 | | 12807 | | |
| 10 | හාම්පුතුන් සමඟ කතිකාවත - Conducting of Employer Forums | 19 | 0.346 | 14 | 0.286 | |
| 11 | අවශ්‍යතාවය අනුව පවත්වන විශේෂ වැඩසටහන් TailormadeProgrammes for Companies and Job Seekers | 10 | 0.300 | 35 | 0.300 | - |
| | **කළමනාකරණ තොරතුරු පද්ධතිය - MIS** | | | | | |
| 12 | මූලික ව්‍යාපාර අධ්‍යයනය -Business Analysis Study | 100% | 0.500 | 90% | 0.515 | - |
| 13 | තෝරාගත් දිස්ත්‍රික්ක සඳහා ක්ෂේත්‍ර නිලධාරීන් වෙනුවෙන් ලැප්ටොප් යන්ත්‍ර මිලදීගැනීම | 100% | 5.000 | 100% | 4.925 | 47 |
| | **සුනිසි මෙහෙවර** | | | | | |
| 14 | ජාතික මානව සම්පත් රැකියා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 100% | - | 20% | 0.005 | - |
| 15 | ලක් රැකියා හරසර වැඩසටහන* | 100% | 2.160 | 100% | 1.833 | - |
| 16 | ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 10 | 0.337 | 13 | 0.337 | 484 |
| 17 | නුවර එළිය දිස්තික් රැකියා කේන්ද්‍රය ආරම්භ කිරීම* | 100% | 0.902 | 100% | 0.772 | - |
| 18 | කොරියානු රාජ්‍යාන්තික මැදිහත් වීම මත සේවා නියුක්තිය හා ශ්‍රම වැඩසටහන් පිළිබඳ ප්‍රතිපත්ති උපදේශන වැඩසටහන* | 100% | 0.128 | 100% | 0.128 | - |
| 19 | අවශ්‍යතා මත පුහුණු විශේෂ පුහුණු වැඩසටහන* | 9 | 0.204 | 9 | 0.205 | 381 |

6.3.1 රැකියාගත කිරීම් 2018/12/31 දක්වා ප්‍රගතිය

| | දිස්ත්‍රික්කය | සෘජු රැකියා ගත කිරීම් | | ස්වයං රැකියාලාභින්/ව්‍යවසායකයින් බිහි කිරීම |
|---|---|---|---|---|
| | | දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර මගින් | ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් | |
| 01 | කොළඹ | 408 | 294 | 15 |
| 02 | ගම්පහ | 349 | 352 | 92 |
| 03 | කළුතර | 205 | 589 | 64 |
| 04 | මහනුවර | 490 | 427 | 63 |
| 05 | මාතලේ | 139 | 172 | 6 |
| 06 | නුවරඑළිය | 0 | 131 | 0 |
| 07 | ගාල්ල | 176 | 409 | 115 |
| 08 | මාතර | 163 | 496 | 90 |
| 09 | හම්බන්තොට | 236 | 365 | 57 |
| 10 | යාපනය | 442 | 259 | 206 |
| 11 | මන්නාරම | 105 | 76 | 49 |
| 12 | වවුනියාව | 148 | 68 | 38 |
| 13 | මුලතිව් | 24 | 0 | 20 |
| 14 | කිලිනොච්චිය | 32 | 78 | 80 |
| 15 | මඩකලපුව | 113 | 122 | 206 |
| 16 | අම්පාර | 277 | 447 | 442 |
| 17 | ත්‍රිකුණාමලය | 113 | 61 | 116 |
| 18 | කුරුණෑගල | 511 | 1196 | 521 |
| 19 | පුත්තලම | 31 | 242 | 109 |
| 20 | අනුරාධපුරය | 165 | 112 | 65 |
| 21 | පොළොන්නරුව | 150 | 50 | 38 |
| 22 | බදුල්ල | 561 | 126 | 104 |
| 23 | මොණරාගල | 118 | 147 | 10 |
| 24 | රත්නපුර | 192 | 394 | 131 |
| 25 | කෑගල්ල | 626 | 420 | 116 |
| | එකතුව | 5774 | 7033 | 2753 |

**මුළු සේවා නියුක්තිය - 15,560**

6.3.2 දිස්ත්‍රික් රැකියා පොළ වැඩසටහනෙහි ප්‍රගතිය -2018

| | දිස්ත්‍රික්කය | ස්ථානය | පවත්වන ලද දිනය | රැකියා අපේක්ෂිතයන් ගණන | සහභාගී වූ ආයතන ගණන | පුහුණු ආයතන ගණන | රැකියා ගත කිරීම | රැකියා ගැලපීම | වියදම (රු) |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | මාතලේ | පාක්‍යම් ජාතික පාසල | 2018/03/24 | 549 | 13 | 02 | 44 | 313 | 107,670 |
| 02 | අම්පාර | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2018/05/05 | 1876 | 12 | 06 | 68 | 516 | 94,500 |
| 03 | අනුරාධපුර | නිවන්තක චෛතිය ජාතික පාසල | 2018/05/26 | 425 | 25 | 6 | 42 | 214 | 123,055 |
| 04 | යාපනය | වෙම්බඩි බාලිකා විද්‍යාලය | 2018/07/21 | 985 | 33 | 10 | 191 | 479 | 144,100 |
| 05 | බදුල්ල | සේනානායක ක්‍රීඩාංගනය | 2018/09/22 | 1350 | 34 | 08 | 163 | 563 | 298,500 |
| 06 | රත්නපුර | ධර්මපාල විද්‍යාලය | 2018/10/13 | 645 | 30 | 10 | 114 | 771 | 207,042 |
| 07 | වවුනියාව | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | 2018/10/30 | 785 | 20 | 09 | 28 | 85 | 161,908 |
| | එකතුව | | | 6615 | 167 | 51 | 650 | 2941 | 1,136,775 |

6.3.3 සේවා යෝජකයන් සමග පවත්වන ලද විශේෂ වැඩසටහන්

| දිනය | ස්ථානය | සහභාගීත්වය (ආයතන සංඛ්‍යාව) | වැයශීර්ෂය | වියදම රු. |
|---|---|---|---|---|
| **BOI යටතේ ලියාපදිංචි ව්‍යවසායක ආයතන සමග සාකච්ඡා** | | | | |
| 2018 පෙබරවාරි 27 | බියගම | 14 | - | - |
| 2018 අප්‍රේල් 02 | කටුනායක | 13 | 2 2509 | 1,180.00 |
| 2018 අප්‍රේල් 27 | පල්ලෙකැලේ | 18 | 2 2509 | 650.00 |
| 2018 මැයි 30 | වතුපිටිවල | 10 | 2 2509 | 1,145.00 |
| **දිස්ත්‍රික් ව්‍යවසායක සමුළු** | | | | |
| 2018 අප්‍රේල් 18 | අම්පාර | 8 | 11 2509 | 11,625.53 |
| 2018අප්‍රේල්26 | කළුතර | 52 | 2 2509 | 35,450.00 |
| 2018 ජුනි 12 | කොළඹ | 25 | 2 2509 | 59,590.00 |
| 2018 ජුනි 20 | යාපනය | 35 | 11 2509 | 32,500.00 |
| 2018 ජුනි 25 | ගම්පහ | 47 | 2 2509 | 51,100.00 |
| 2018 ජුලි 25 | මාතර | 74 | 2 2509 | 40,710.00 |
| 2018 සැප්තැම්බර් 13 | රත්නපුර | 43 | 2 2509 | 46,080.00 |

මේ මගින් සේවා යෝජකයන් හා දිස්ත්‍රික් රැකියා කේන්ද්‍ර හා ජාතික රැකියා කේන්ද්‍ර අතර එනම් සමස්ථයක් වශයෙන් දෙපාර්තමේන්තුවත් දෙපාර්තමේන්තුවේ සේවය සැපයිය හැකි සේවා යෝජකයන් අතරත් යහපත් සම්බන්ධතාවයක් ඇති කර ගැනීම මගින් රැකියා සේවා ලබා ගැනීම හා සැපයීම අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ සලසා ගැනීම මෙහි මූලික අරමුණ වේ.

## 6..3.4 සුනිසි මෙහෙවර වැඩසටහන් වල ප්‍රගතිය

### 6.3.4.1 ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | වැඩසටහන පැවැත්වූ දිනයන් | වියදම (රු) |
|---|---|---|---|---|
| 01 | ගාල්ල | අම්බලන්ගොඩ | 2018 ජුනි 4,5,6 | 21,050 |
| 02 | පුත්තලම | ආණමඩුව | 2018 ජුලි 9,10,11 | 21,130 |
| 03 | කුරුණෑගල | ගල්ගමුව | 2018 ජුලි 23,24,25 | 25,859 |
| 04 | පොළොන්නරුව | වැලිකන්ද | 2018 අගෝ. 14,15,16 | 21,050 |
| 05 | නුවරඑළිය | කොත්මලේ | 2018 අගෝ. 23,24,25 | 22,120 |
| 06 | වවුනියාව | වවුනියාව | 2018 අගෝ. 27,28,29 | 21,050 |
| 07 | අනුරාධපුර | ගලෙන්බිඳුනු වැව | 2018 සැප්. 6,7,8 | 27,710 |
| 08 | මහනුවර | ගඟ ඉහළ කෝරළේ | 2018 සැප්. 19,20,21 | 21,050 |
| 09 | කෑගල්ල | වරකාපොල | 2018 සැප්. 26,27,28 | 21,050 |
| 10 | කොළඹ | කඩුවෙල | 2018 සැප්. 26, ඔක්.10,11 | 21,050 |
| 11 | ගාල්ල | අම්බලන්ගොඩ | 2018 නොවැ.14,15,16 | 26,850 |
| 12 | අම්පාර | ලාහුගල | 2018 ඔක්.31,නොවැ.1,2 | 21,050 |
| 13 | කොළඹ | හෝමාගම | 2018 නොවැ.13,21,23 | 24,460 |
| | එකතුව | | | 295,479 |

### 6.3.4.2 විශේෂ ව්‍යාපෘති - අවශ්‍යතා මත පුහුණු වැඩසටහන්

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | වැඩසටහන | වැඩසටහන පැවැත්වූ දිනයන් | වියදම (රු) |
|---|---|---|---|---|---|
| 01 | කොළඹ | මොරටුව | සාරි හැට්ට මැසීම | 2018 නොවැ.15,16 | 11,100 |
| 02 | | කඩුවෙල | කේක් සකස් කිරීම | 2018 දෙසැ.03,6,11 | 34,879 |
| 03 | | කෝට්ටේ | තිරරෙදි මැසීම | 2018 නොවැ.19,21,23,26 | 23,200 |
| 04 | | හෝමාගම | රූපලාවන්‍ය | 2018 නොවැ.19,21,23 | 19,450 |
| 05 | | කැස්බෑව | තිර රෙදි පුහුණුව | 2018 නොවැ.30,දෙසැ.3,4,6,7 | 32,650 |
| 06 | කෑගල්ල | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය | මී මැසි පාලනය | 2018 නොවැ.29 | 21,150 |
| 07 | | වරකාපොල | ගෘහ විදුලි උපකරණ අළුත් වැඩියා කිරීම | 2018 දෙසැ.4,5 | 12,000 |
| 08 | | දැරණියගල | අලවිකරණය හා ඇසුරුම්කරණය | 2018 දෙසැ.4,5,6 | 40,075 |
| 09 | කුරුණෑගල | කුලියාපිටිය - බටහිර | ඇඳුම් මැසීම | 2018 නොවැ.27,29 | 10,600 |
| | එකතුව | | | | 205,104 |

6.3.4.3 ලක් රැකියා හරසර වැඩසටහන




මෙම වැඩසටහන 2018 වර්ෂයේ දෙසැම්බර් 13 වෙනි දින සුහුරුපාය ප්‍රධාන සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි.සේවා යෝජකයන් හා දෙපාර්තමේන්තු සේවක මණ්ඩලය යන පාර්ශව දෙකහිම සහභාගිත්වයෙන් සිදු කෙරෙන නියමු ව්‍යාපෘතියකි.මෙහිදී රැකියා ලබා දීම හා අනෙකුත් පහසුකම් සැපයීම සම්බන්ධව සේවා යෝජකයන් ඇගයීමට ලක් කරන ලදි.එසේම රැකියා අපේක්ෂිතයන් රැකියා ගත කරවීම ප්‍රමුඛ කොට ගෙන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්කයන් ලඟා කර ගැනීම පිළිබඳව දෙපාර්තමේන්තු නිලධාරීන් ඇගයීම සිදු කරන ලදි.මෙහිදී කණ්ඩායම් ගොඩනැගීම, එක් එක් සේවකයාගේ හැකියාවන් ඔප් නංවා උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීම තුළින් දෙපාර්තමේන්තුවේ මානව සම්පත ජාතික අරමුණු සාක්ෂාත්කර ගැනීම අපේක්ෂිතය. දිස්ත්‍රික් වශයෙන් දෙපාර්තමේන්තු සේවකයන් ඇගයීමට ලක්කරන ලද අතර තෝරා ගත් දිස්ත්‍රික්ක තුනක සේවා යෝජක ආයතන ඇගයීම සිදු කරන ලදි. මෙම නියමු ව්‍යාපෘතියේ සේවා යෝජකයන් ඇගයීමට ලක් කරන ලද්දේ යාපනය,කුරුණෑගල හා අම්පාර යන දිස්ත්‍රික්ක තුල වේ.මෙම ව්‍යාපෘතියට ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති අතර එය 2019 -2021 මධ්‍යකාලීන අයවැය රාමුව ඔස්සේ ප්‍රතිපාදන සැලසීමට නිර්දේශ කර ඇත.

6.3.4.4 කොරියානු රාජ්‍ය ත්‍රාන්තික මැදිහත් වීම මත සේවා නියුක්තිය හා ශ්‍රම වැඩසටහන් පිළිබඳ ප්‍රතිපත්ති උපදේශන වැඩසටහන

කොරියානු ජනරජය විදේශ රටවල් සමග විශේෂයෙන්ම සේවා නියුක්තිය හා කම්කරු ක්ෂේත්‍රය පිළිබඳ ද්වීපාර්ශවීය සම්බන්ධතාවය පැවැත්වීමේදී විශේෂ වැදගත්කමක් ශ්‍රී ලංකාව වෙත ලබා දී ඇත. 2016 දී සේවා නියුක්තිය හා කම්කරු කටයුතු පිළිබඳ කොරියානු අමාත්‍යාංශය ශ්‍රී ලංකාවේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය සමග සහයෝගීතා වැඩසටහන් ආරම්භ කරන ලදි.2018 වර්ෂයේදී ද මේ පිළිබඳ කොරියානු මහාචාර්ය වරුන් ඇතුළු සේවා නියුක්තිය, වෘත්තීය මාර්ගෝපදේශනය, මහජන රැකියා සේවා සැලසුම් කිරීම,ක්‍රියාත්මක කිරීම හා ඇගයීම පිළිබඳ කණ්ඩායමක් ශ්‍රී ලංකාවේ සංචාරය කරන ලදි.මෙහිදී කොරියානු ජනරජය හා සේවා නියුක්තිය හා මහජන රැකියා සේවය පිළිබඳ ද්වී පාර්ශවික අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදි.මෙවර මහජන රැකියා සේවයේ ව්‍යුහය වෘත්තීය මාර්ගෝපදේශන ලබා දීම හා මාර්ගගතව මහජන රැකියා සේවා ලබා දීම පිළිබඳව කොරියානු අත්දැකීම් දෙපාර්තමේන්තුව වෙත විස්තර කරන ලදි.එසේම කොරියානු ජනරජයේ මහජන රැකියා සේවය වර්තමාන තත්වයට පත් වීමේදී පසු කරන ලද සන්ධිස්ථාන හා ගැටළු, එම ගැටළු විසඳාගත් ආකාරය පිළිබඳ අප දෙපාර්තමේන්තුව දැනුවත් කරන ලදි. කොරියානු ජනරජයේ සාර්ථක ආදර්ශ (Benchmark) සහය හා

උපදේශකත්වය මත ශ්‍රී ලංකාවේ මහජන රැකියා සේවය වැඩි දියුණු කිරීම පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට යෝජනා වී ඇත.

6.3.4.5 නුවරඑළිය රැකියා කේන්ද්‍රය ආරම්භ කිරීම

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව දිස්ත්‍රික් රැකියා කේන්ද්‍රයන් ස්ථාපිත කිරීම මගින්,

I. දිස්ත්‍රික්කයේ තරුණ විරැකියාව අවම කිරීම
II. රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීම
III. රැකියා ඇබෑර්තු ලියාපදිංචිය
IV. රැකියා ගැලපීම හා රැකියාගත කිරීම
V. ශ්‍රම වෙළඳ පොළ පිළිබඳව රැකියා අපේක්ෂිතයන් දැනුවත් කිරීම,
VI. තම තමන් අභිමත වෘත්තීය ක්ෂේත්‍රයන්ට පිවිසීම සඳහා පුහුණු ආයතන රැකියා අපේක්ෂිතයන්ට හඳුන්වා දීම

ප්‍රධාන වශයෙන් අපේක්ෂිතය.මෙහිදී එක් මධ්‍යස්ථානයක් මගින් රැකියා ආශ්‍රිත සේවා සියල්ල ලබා දීම ප්‍රධාන ක්‍රමවේදයයි. මේ සඳහා නුවර එළිය රැකියා කේන්ද්‍රය 2018 වර්ෂයේ සුනිසි මෙහෙවර ප්‍රතිපාදන මත ස්ථාපනය කරන ලදි.